# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/01/Circular | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2024.01.04 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ මනාපය පල කළ නිලධාරීන් විසින් අතීත සේවා කාලයට අදාළ හිඟ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු ප්‍රතිලාභ මුදල් ගෙවීම සම්බන්ධවයි</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත නිකුත් කළ මාගේ සමාංක හා 2023.10.09 හා 2023.12.02 දිනැති ලිපි හා බැඳේ.

02. මේ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක Pen/pol/1C/480 හා 2023.12.06 දිනැති ලිපිය මඟින් ඉහත නිලධාරීන් විසින් අතීත සේවා කාලයට ගෙවිය යුතු හිඟ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ගෙවීමේ දී 2023.06.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 (සංශෝධන 1) පාදක කර ගැනීමට නෛතික බාධාවක් නොමැති බව ගරු නීතිපතිතුමා විසින් දැනුම් දී ඇත.

03. ඒ අනුව, සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ මනාපය පල කර අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් අතුරින් තවදුරටත් අතීත අයිකාරි කාලයට අදාළව ගෙවිය යුතු හිඟ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ගෙවීමේ දී (2023.06.01 දින සිට) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 (සංශෝධන 1) ට අනුව ගෙවීම් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දීමට හා ගණනය කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි. (අදාළ චක්‍රලේඛ උපදෙස් පාදක කර ගැනීමට කටයුතු කරන්න)

සි.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. විගණකාධිපති - කා.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි - දැ.ගැ.ස. හා අ.ක.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.
6. සියළුම අංශ ප්‍රධානීන් - නිලධාරීන් දැනුවත් කිරීම සඳහා
7. සියළුම වෘත්තීය සංගම් ලේකම්වරුන් - අ.ක.ස.